පොල් පර්යේෂණ මණ්ඩලය - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

පොල් පර්යේෂණ මණ්ඩලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ , 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 හි 39 සිට 43 වගන්තිය දක්වා වූ විධිවිධාන ප්‍රකාරව ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා ශක්‍යතාවයන් ගලා ඒමක් පැන නගින බවට බොහෝ සෙයින් නිශ්චිත නම් පමණක් ආදායම් ලෙස හඳුනාගත යුතු වුවත් සේවය හැර ගිය නිලධාරිණියකගෙන් ලැබිය යුතු ලෙස හඳුනාගත්, ලැබීම නිශ්චිත නොවූ රු.10,921,575 ක් ණයගැතියෝ හර කර සමුච්චිත අරමුදලට බැර කර තිබුණි.	නිලධාරිනිය සේවා ගිවිසුම කඩ කිරීම හේතුවෙන් ඇයගෙන් ආයතනයට අයවිය යුතු ගෙවන ලද වැටුප්, දීමනා, සේවක අර්ප සාධක දායකය ගෙවන අවස්ථාවේදී ආයතනයට වියදමක් වූ සියලු මුදල් ආදායමට එරෙහිව ලැබිය යුතු ආදායම පෙර වර්ෂයට ගලපා ඇත.සමුච්චිත ලාභයට ගලපා ඇත.	රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතුය.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 2024 වර්ෂයේ ගොඩනැගිලි අලුත්වැඩියා වියදම් සඳහා දරන ලද රු. 18,391,145 ක් ගොඩනැගිලි පිරිවැය ලෙස ප්‍රාග්ධනිත කර තිබූ බැවින් ගොඩනැගිලි ගිණුම අධිගණනය වී වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අධිප්‍රමාණය වී තිබුණි.	ආයතනය විසින් දරනු ලබන වියදමක් ප්‍රවර්තන වර්ෂයේදී වියදමක් ලෙස හෝ ප්‍රාග්ධනිත වියදමක් ලෙස හඳුනාගෙන එය ඉදිරි නිශ්චිත වර්ෂ ප්‍රමාණයකදී ක්ෂය වශයෙන් ලියා හරිනු ලබන්නේ ආයතනය විසින් දරන ලද වියදම් හි ස්වභාවය පිළිබඳ සැලකිලිමත් වෙමිනි. ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මෙම වියදම් ප්‍රාග්ධනිත කර	අළුත්වැඩියා වියදම් ප්‍රාග්ධනිත නොකළ යුතුය.

	ඇති අතර ඒ සඳහා වූ වාර්ෂික ක්ෂය ප්‍රමාණය ගිණුම්ගතකර ඇත.	
(ආ) පෙර වර්ෂයන්ගේ නිල නිවාස අළුත්වැඩියා වියදම වූ රු.552,322 ක් සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි පිරිවැය ලෙස සැලකීම හේතුවෙන් ගොඩනැගිලි වටිනාකම රු.552,322 කින් අධිගණනය වී තිබූ අතර සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් අධිප්‍රමාණය වී තිබුණි.	සිදුවී ඇති දෝෂය පිළිගන්නා අතර මෙය 2025 වර්ෂයේ ගිණුම් තුළින් නිවැරදිව ගැලපීමට කටයුතු කරන බව දන්වමි.	අළුත්වැඩියා වියදම් ප්‍රාග්ධනිත නොකළ යුතුය.
(ඇ) විදුලි සම්බන්ධතා ලබා ගැනීමේදී ආයතනය විසින් ගෙවා තිබූ විදුලි තැන්පත් මුදල වන රු 500,000.ක වටිනාකම ලැබිය යුතු වටිනාකමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොමැත.	විදුලි ගිණුම් අංක 5070000020 ට අදළ තැන්පත් මුදල් වන රු.500,000 මුදල ලැබිය යුතු වටිනාකමක් ලෙස 2025 වර්ෂයේ දී ගිණුම්ගත කරන බව දන්වමි.	විදුලි තැන්පතුව ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම්ගතකළ යුතුය.
(ඈ) 2023 දෙසැම්බර් මාසය සඳහා වන රු.1,387,988 ක විදුලි වියදම සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම හා සමුච්චිත ලාභය වැඩියෙන් ගිණුම්ගත වී තිබුණි.	2023 දෙසැම්බර් මාසයේ විදුලි වියදම් බැරකම් ලෙස ගිණුම්ගත කිරීම සඳහා අදාල වැය ශීර්ෂය තුළ ප්‍රතිපාදන නොතිබූ බැවින් එය ප්‍රවර්තන වර්ෂය සඳහා ගිණුම්ගත කර ඇත. දැනටමත් සමුච්චිත ලාභයට ගැලපී ඇති බැවින් ඉදිරියේදී අදාල වර්ෂයේ වියදමට ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වමි.	ප්‍රමාණවත් ලෙස ප්‍රතිපාදන ලබා ගත යුතුය.
(ඉ) කිණියම ව්‍යාපෘතිය සඳහා රු.3,019,750 ක සූර්ය විදුලි බල පද්ධතියක් ලබා ගැනීමට අදාළව සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද රු.2,482,500 ක් වූ ප්‍රාග්ධන වටිනාකම වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි .මේ හේතුවෙන් ජංගම නොවන වත්කම් වටිනාකම රු.3,019,750 ක් අඩුවෙන් ද සමාලෝචිත වර්ෂයේ වියදම රු.2,482,500 ක් වැඩියෙන් ද ගෙවිය යුතු වටිනාකම රු.537,250 ක් අඩුවෙන් ද වාර්තා වී තිබුණි.	සිදුවී ඇති දෝෂය පිළිගන්නා අතර මෙය 2025 වර්ෂයේ ගිණුම් තුළින් නිවැරදිව ගැලපීමට කටයුතු කරන බව දන්වමි.	ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඊ) ආයතන සංග්‍රහයේ ix වැනි පරිච්ඡේදයේ 2.2 වගන්තිය ප්‍රකාරව නවසීලන්තයේ Castalia සමාගම සමග අත්සන් කරන ලද Vanuatu Coconut Oil for Fuel Strategies සඳහා වන උප කොන්ත්‍රාත්තුවට	අදාළ මුදල 2025 වර්ෂයේදී ආයතන සංග්‍රහයේ IX පරිච්ඡේදයේ 2.2 ප්‍රකාරව ඒකාබද්ධ අරමුදල වෙත බැර කිරීමට කටයුතු කරන බව දන්වමි.	ආයතන සංග්‍රහයේ වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුයි.

අදාළව සමාලෝචිත වර්ෂය තුළ ලද රු.705,080 ක් ඒකාබද්ධ අරමුදල වෙත බැර කළ යුතු වුවද, එම වටිනාකම පොල් පර්යේෂණ මණ්ඩලයේ ආදායමක් ලෙස හඳුනා ගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.705,080 කින් වැඩියෙන් ගිණුම්ගත වී තිබුණි.

1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
1972 මාර්තු 30 දිනැති ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ 1 වැනි කොටස 1 ඡේදයේ 1වැනි උපලේඛනයේ 1 වගන්තිය ප්‍රකාරව	i. පළිබෝධ නිවාරණය කිරීම හා සුව කිරීම සඳහා පර්යේෂණ සිදුකිරීම මණ්ඩලයේ කාර්යයක් වුවද 2019 වර්ෂයේ සිට පැතිර යන සුදු මැස්සා හානිය නිවාරණය කිරීම හෝ පාලනය කිරීමකින් තොරව පසුගිය වසර 06 තුල ශ්‍රී ලංකාවේ පොල් වගාව ආශ්‍රිතව සීඝ්‍රයෙන් පැතිර ගොස් තිබුණි.	සුදු මැස්සා පාලනය කිරීම සඳහා මුලදී නිර්දේශ කළ කෘත්‍රිම රසායන පළිබෝධනාශක 03 ට අමතරව කොහොඹ තෙල්, සබන් හා ජලය මිශ්‍ර කොට සාදා ගත හැකි පරිසර හිතකාමී කෘමිනාශකයක් මෙම උවදුර පාලනය කිරීම සඳහා පසුකාලීනව නිර්දේශ කරන ලදී. එමෙන්ම කහ පැහැති ඉටිකොළ වල ග්‍රීස් ආලේප කර පොල් ගසේ කද වටා එතීමේ උගුල් ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී.	පළිබෝධ නිවාරණය කළ යුතුය.
	ii. අපනයන වෙළඳපලට තැඹිලි සපයන එකම රට ශ්‍රී ලංකාව වන අතර රට තුළ පවත්නා තැඹිලි විශේෂ අතර රසයෙන් ගුණයෙන් ඉහළ තැඹිලි ප්‍රභේද හඳුනගෙන ව්‍යාප්ත කිරීම සඳහා ඒ පිළිබඳ අදාළ අධිකාරීන් වෙත නිර්දේශ නිකුත් කරමින් තැඹිලි නිෂ්පාදනය ඉහළ නංවා ගැනීමට කටයුතු කර නොතිබුණි.	පොල් වගා කිරීමේ මණ්ඩලයට අවශ්‍ය අවස්ථාවන්හිදී තාක්ෂණික උපදෙස් ලබා දීම පොල් පර්යේෂණ ආයතනයෙන් සිදු කරන බව කාරුණිකව දන්වමි. එමෙන්ම තැඹිලි බීජ නිෂ්පාදනය සඳහා මව් ශාක සහිත සංචිතයක් මේ වන විටත් පොල් පර්යේෂණ ආයතනයෙහි ස්ථාපනය කර ඇත. ඒ අනුව තැඹිලි නිෂ්පාදනය ඉහල දැමීම සඳහා පොල් පර්යේෂණ ආයතනය අවශ්‍ය දායකත්වය සපයනු ලබන බව දන්වමි.	පනත අනුව තැඹිලි වගාව පුළුල් කිරීම හා අපනයනයට අදාළ නිර්දේශ නිකුත් කිරීමේ බලය මණ්ඩලය සතුවන බැවින් ඒ පරිදි ක්‍රියා කළ යුතුයි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.114,444,359 ක ඌණතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 8,369,043 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.122,813,402 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ජාන සම්පත් හා පර්යේෂණ මධ්‍යස්ථාන ආදායම හා වෙනත් ආදායම් පිළිවෙලින් රු.21,773,336 කින් හා රු. 136,531,879 කින් පහළ යාමද සැපයුම් හා පාරිභෝජන ද්‍රව්‍ය භාවිතා කිරීම් හා ජාන සම්පත් සහ පර්යේෂණ මධ්‍යස්ථාන වියදම් පිළිවෙලින් රු.22,680,824 කින් සහ රු.60,968,462 කින් වැඩි වීමද මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන් වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්, ඉකුත් වර්ෂය සමඟ සසදා පහත පරිදි වේ.

විෂය	2024 වර්ෂය රු.	2023 වර්ෂය රු.	විචලනය රු.	විචලනය ප්‍රතිශතයක් ලෙස
ආදායම් ----------				
භාණ්ඩාගාර ලැබීම්	329,435,080	326,946,000	2,489,080	1
ජාන සම්පත් මධ්‍යස්ථාන ආදායම	331,235,580	353,008,916	(21,773,336)	(6)
වෙනත් ආදායම	20,294,538	156,826,417	(136,531,879)	(87)
වියදම් --------				
වැටුප් වේතන සහ සේවක ප්‍රතිලාභ	233,718,271	234,122,833	(404,562)	0
සැපයුම්	103,811,172	81,130,348	22,680,824	28
ජාන සම්පත් මධ්‍යස්ථාන වියදම්	399,523,171	338,554,709	60,968,462	18
පර්යේෂණ හා සංවර්ධන වියදම් කපා හැරීම්	51,784,603	45,617,368	6,167,235	13.5
වෙනත්	68,397,491	85,804,371	(17,406,880)	(20)

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 අනාර්ථික ගනුදෙනු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)කිණියම පොල් වගා ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අක්කර 141 ක භූමි ප්‍රමාණය ආවරණය වන ආකාරයට පෞද්ගලික සමාගමකට රු.24,351,906 ක් ගෙවා නළ ජල පද්ධතියක් සවි කර තිබුණ ද මුළු භූමි භාගයම	අවශ්‍ය ධාරිතාව නොමැති වීම නිසා හා නළ වාරි පද්ධතියේ කොටසක පොල් ගස් 1600 කට පමණ අක්කර 25 කට නළ වාරි පද්ධතිය මගින් ජලය සපයනු ලැබේ. කිණියම බීජ පොල් උයනේ අක්කර 141 මුළු භූමි ප්‍රමාණය සඳහා ජලය ලබා දීමට 2018 වර්ෂයේ ප්‍රතිපාදන මගින් ජල නළ	කිනියම බීජ පොල් උයනේ ඇති ජලනළ පද්ධතියෙන් කාර්යක්ෂම කාර්ය සාධනයක් ලබා ගැනීම සඳහා සුදුසු විකල්ප ජල සැපයුම් ක්‍රම අනුගමනය කළ යුතුය.

ආවරණය වන සේ සිටුවන ලද සියළුම ශාකවලට ජලය සැපයීමට එම ජල පද්ධතියට නොහැකි වී තිබුණි.	පද්ධතියක් ඉදි කිරීම සිදු කර ඇත. විනාඩියකට ජලය ලීටර 200 ක් ලබාගත හැකි බවට ජල සම්පාදන මණ්ඩලය මගින් ලබා දී තිබූ වාර්තාවක් පදනම් කරගෙන කිණියම බීජ පොල් උයනේ භූගත ළිදෙන් (Deep Well) ජලය ලබා ගැනීමට සැලසුම් කර මෙම ජලනළ පද්ධතිය ඉදිකර ඇත. වියලි කාලයේදී විනාඩියකට ජලය ලීටර 200 ක් පොම්ප කිරීමට නොහැකි බැවින් නළ ළිදෙන් ජලය රඳවා ගබඩා කළ හැකි ජල රඳවනයක් සකසා (water sump) ජල නළ පද්ධතිය නවීකරණය කරන ලදි.	
(ආ)පොල් පර්යේෂණ ආයතනය විසින් ජාන සම්පත් මධ්‍යස්ථාන 3 ක්, පර්යේෂණ මධ්‍යස්ථාන 6 ක් සහ එක් ආදර්ශ ගොවිපලක් පවත්වාගෙන යන අතර එම ආයතන සියල්ලෙන්ම 2024 වර්ෂයේ ලැබූ ඵලදාව පොල් ගෙඩි 2,962,751 ක් වූ අතර එය 2023 වර්ෂයට සාපේක්ෂව පොල් ගෙඩි 548,064 ක අඩුවීමක් එනම් ප්‍රතිශතයක් වශයෙන් සියයට 15 ක අඩුවීමක් විය.	• පොහොර සම්බන්ධයෙන් පසුගිය සමයේදී පැවති රජයේ ප්‍රතිපත්තිය හේතුවෙන් වෙළඳපල තුළ රසායනික පොහොර නොමැතිවීම හේතුවෙන් 2022 හා 2023 වර්ෂවල පොල් පර්යේෂණ ආයතනයේ පර්යේෂණ හා ජාන සම්පත් මධ්‍යස්ථාන සඳහා පොහොර මිලදී ගැනීම සිදුකල නොහැකි විය. මෙහි බලපෑම 2023 වර්ෂයේ සිට ඉදිරි වර්ෂ 02 ක් පමණ බලපානු ඇත . • පොල් වගාවේ සාර්ථක අස්වැන්නක් ලැබීමට නම් වසර පුරා පැතිරුණු මිලි මීටර් 1500ට වඩා වැඩි වාර්ෂික වර්ෂාපතනයක් ලැබිය යුතුය. පර්යේෂණ හා ජාන සම්පත් මධ්‍යස්ථාන සියල්ල ආවරණය වන පරිදි 2022 වර්ෂයේදී ලද වාර්ෂික වර්ෂාපතනය ප්‍රමාණාත්මකව අඩුය . එමෙන්ම ,හොඳින් වර්ෂය පුරාම පැතිරුණු වර්ෂාපතනයක් ද නොලැබුණි .ඒ හේතුවෙන් 2022 වර්ෂය තුලදී තෙත් දින ගණන අඩුවීම නිසා 2022 වර්ෂයේ දී හටගන්නා පොල් මල් වලින් 2023 හා 2024 වර්ෂවලදී ලැබුණු පොල් ඵලදාව සැලකිය යුතු අඩුවීමක් විය. • 2023 වර්ෂයේ පාරිසරික උෂ්ණත්වය ද ඉහල අගයක් ගත් අතර, ඒ හේතුවෙන් පරාගණය නිසි ආකාරයෙන් සිදු නොවීම නිසාද පොල් අස්වැන්න අඩුවේ.	පොල් වගාවට ප්‍රමාණවත් පොහොර සහ ජලය සැපයීම තුළින් අස්වැන්න වැඩිකර ගැනීමට කටයුතු කළ යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය		කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2023 ජූලි 06 දින පැවති රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේදී පොල් පර්යේෂණායතනය සඳහා පහත සඳහන් නිර්දේශ 03 ක් ලබා දී තිබුණු අතර වසර 2 කට ආසන්න කාලයක් ගත වී තිබුණත් එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන නොතිබුණි.		
i.	පොල් වගාව ආශ්‍රිතව සුදු මැස්සා හානිය හදිසි ආපදා තත්ත්වයක් ලෙස සලකා ආයතන 3 න්ම (පොල් පර්යේෂණ ආයතනය, පොල් වගා කිරීමේ මණ්ඩලය සහ පොල් සංවර්ධන අධිකාරිය) මේ සඳහා පොල් වගා ආපදා කළමනාකරණ ඒකකයක් පිහිටුවීම සිදුකර තිබුණද, සැලැස්මක් පිළියෙල කර ආපදාවෙන් ආරක්ෂා වීමට කටයුතු කර නොතිබුණි.	පොල් පර්යේෂණ ආයතනය, පොල් වගාකිරීමේ මණ්ඩලය සහ පොල් සංවර්ධන අධිකාරිය ඒකාබද්ධව සුදුමැස්සා ඇතුලු හදිසි ආපදා තත්ත්ව කළමනාකරණය සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයක් පිහිටුවා ඇත.	හදිසි ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ක්‍රියාකාරී මට්ටමට ගෙන ඒමට එහි කළමනාකාරීත්වය කටයුතු කළ යුතුය.
ii.	මණ්ඩලයේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම	මණ්ඩලයේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම 2022.04.26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 මගින් රාජ්‍ය වියදම් පාලනය කිරීම සඳහා ලබා දී ඇති උපදෙස් ප්‍රකාරව සියලු බඳවා ගැනීම් අත්හිටුවීම හේතුවෙන් පුරප්පාඩු ප්‍රමාණයක් සම්පූර්ණ කරගැනීමට පොල් පර්යේෂණ ආයතනයට නොහැකි විය.	අත්‍යවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කළ යුතුය.
iii.	ආයතනයේ පර්යේෂණ නිලධාරීන් වැඩි වැටුප් සහිත වෘත්තීන් සඳහා අයදුම්කර මණ්ඩලය හැර යාම වැළැක්වීම සඳහා මුදල් අමාත්‍යාංශය සමග සාකච්ඡා කර වැටුප පිළිබඳ නොඑකගතා ඉවත් කිරීමට කටයුතු කිරීම	ආයතනයේ අත්‍යාවශ්‍ය පුරප්පාඩු පිරවීම සඳහා අඛණ්ඩව සිදු කරන ලද ඉල්ලීම් හා සේවා අවශ්‍යතාවය සලකා බලා පුරප්පාඩු 67 ක් පිරවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2023 නොවැම්බර් සිට 2024 අප්‍රේල් තෙක් අවස්ථා 3 කදී 2024 පුරප්පාඩු 26 ක් සඳහා නව බඳවා ගැනීම් සිදු කරන ලදි. තවත් එක් පුරප්පාඩුවක් පිරවීම සඳහා අදාළ දැන්වීම් පළ කර අනුමත බඳවාගැනීමේ පරිපාටිය අනුව අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ නිර්දේශය, මණ්ඩලීය අනුමැතිය සමග අමාත්‍ය අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී තනතුර, අභ්‍යන්තරව පමණක් බඳවා ගනු ලබන තනතුරු, කළමනාකරු (බීජ පොල් උයන්)	පර්යේෂණ නිලධාරීන් ආයතනය තුළ රඳවා ගැනීමට අදාළ ක්‍රමවේදයක් සකස් කළ යුතුයි.

	තනතුරු, ප්‍රාථමික ගණයේ තනතුරු ආයතනයේ පුරප්පාඩු පිරවීම සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලයේ ක්‍රියාත්මක වන රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.	
(ආ) 2014 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා ආරම්භ කරන ලද පර්යේෂණ ව්‍යාපෘති 6 ක් අතරමඟ නතර කර තිබූ අතර ඒවා නතර කරන අවස්ථාව වන විට රු.මි 12.76. ක් ඒකාබද්ධ අරමුදලින් ප්‍රාග්ධන වියදම් ලෙස වැයකර තිබුණි.	මෙම පර්යේෂණ සියල්ල අත්හැර දමා නොමැත. පර්යේෂණ 06 ක් පමණක් ඇමුණුමේ දක්වා ඇති හේතු පාදක කරගෙන අත්හැර දමා ඇත. ඉතිරි පර්යේෂණ සියල්ල අවසන් කර හෝ ඉදිරියට පවත්වාගෙන යනු ලබන පර්යේෂණ ලෙස ඇමුණුම 02 මගින් තොරතුරු දක්වා ඇත.	අත්හැර දමා ඇති ව්‍යාපෘති නැවත ආරම්භ කිරීමේ හැකියාව සොයා බලා නැවත ආරම්භ කළ යුතුය.
(ඇ) බණ්ඩිරිප්පුව ජාන සම්පත් මධ්‍යස්ථාන භූමියේ වූ පොල් වගාව යටතේ අතුරු භෝගයක් ලෙස ඩ්‍රැගන්ෆෘට් වගාව 2015 වර්ෂයේදී පොල් පර්යේෂණ ආයතනයේ ශෂ්‍ය විද්‍යා අංශය මඟින් ආරම්භ කර ඒ සඳහා රු.1,086,296 ක් වැයකර ආධාරක කණු 350 කට ඩ්‍රැගන්ෆෘට් පැළ 700 ක් සිටුවා තිබුණද 2025 පෙබරවාරි 25 දින සිදු කළ භෞතික පරීක්ෂාවේදී එම ස්ථානයේ ආධාරක කණු පමණක් පැවති බව නිරීක්ෂණය විය. නව වගාවක් ආරම්භ කිරීමට හෝ එම ස්ථානය වෙනත් ඵලදායී කටයුත්තක් සඳහා යොදාගැනීමට මණ්ඩලය විසින් මේ දක්වා කටයුතු කර නොතිබුණි.	2015 වර්ෂයේදී පොල් පර්යේෂණ ආයතනයේ ශෂ්‍ය විද්‍යා අංශය මඟින් ස්ථාපිත කරන ලද ඩ්‍රැගන්ෆෘට් වගාවට අදාල පර්යේෂණ ආදර්ශනය 2019.11.27 දින සිට බණ්ඩිරිප්පුව පර්යේෂණ මධ්‍යස්ථානය වෙත භාර දී ඇත. මෙම ආධාරක කණු මේ වනවිට ගලවා රත්මලාගාර පර්යේෂණ මධ්‍යස්ථානයේ වෙනත් අතුරු බෝග වගාවක්, ශෂ්‍ය විද්‍යා අංශයේ උපදෙස් පරිදි ආරම්භ කිරීම සඳහා සැලසුම් කර ඇත.	ඵලදායී වෙනත් කාර්යයන් සඳහා වගා ආධාරක කණු යොදා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඈ)2024 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන තුළ රඳවාගත් තැන්පතු වටිනාකම වූ රු.6,660,703 කින් රු 4,262,103.ක් වසර 2කට වඩා වැඩි කාලයක් නිරවුල් කිරීමකින් තොරව රඳවා ගෙන තිබුණි.	ආයතනයේ විවිධ කාර්යන්වලදී රඳවා ගනු ලැබූ මුදලින් වර්තමානයේදී ආයතනයේ කොන්ත්‍රාත් කටයුතුවලට සම්බන්ධ නොවූ කොන්ත්‍රාත්කරුවන්ගේ දීර්ඝ කාලයක් තුළ නිදහස් නොකොට පැවති ඇතැම් ශේෂයන් අනුමැතිය සහිතව 2024 වර්ෂයේදී ආදායමට ගෙන ඇති අතර මෙහි පවතින ශේෂයන්ට අදාළ ඇතැම් කොන්ත්‍රාත්කරුවන් ආයතනය සමග තවමත් කටයුතු කරන බැවින් මෙය නිදහස් නොකිරීමට හේතු වී ඇත.	මු.රෙ 571 (6) ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඉ)2022 වර්ෂයේදී බණ්ඩිරිප්පුව ජාන සම්පත් මධ්‍යස්ථානයේ අතුරුබෝග වගාව සඳහා සිටුවන ලද අලිපේර පැළ 44 ක් ද, පේර පැළ 101 ක් ද, කජු පැළ 62 ක් ද සහ රඹුටන් පැළ 56 ක් අනාවරණය කර නොගත් හේතූන් මත මිය ගොස් තිබූ අතර පල්ලම ජාන සම්පත් මධ්‍යස්ථානයේ කුරුඳු	මෙම කරුණ හා එකඟ වේ. නිවැරදි කෘෂි පිළිවෙත් අනුගමනය නොකිරීම, වන සත්ව හානි සහ දැඩි නියඟය හේතුවෙන් අතුරු භෝග පැළ මිය යාමට ලක්ව ඇත.	පැළ විනාශ වීමට හේතු සොයා බලා ඒ සඳහා පිළියම් යෙදිය යුතුය.

පැළ 1,950 ක් ද පොත්තුකුලම ජාන සම්පත් මධ්‍යස්ථානයේ කජු පැළ 54 ක් ද මාදුරු ඔය ජාන සම්පත් මධ්‍යස්ථානයේ පුවක් පැළ 334 ක් ද අඹකැලේ ජාන සම්පත් මධ්‍යස්ථානයේ දෙහි පැළ 385 ක් ද විවිධ හේතූන් මත මියගොස් තිබුණි. ඒ වෙනුවෙන් මුළු වියදම රු.151,512 ක් පොල් පර්යේෂණ ආයතනය විසින් දරා තිබුණි.		
(ඊ) පොල් පර්යේෂණ ආයතනයේ ප්‍රවේණි හා ශාක අභිජනන අංශය විසින් තුනුක්කායි , ආලංකුලම 65 යුධ හමුදා කඳවුරේ අක්කර 5ක භූමි භාගයක 2020 මාර්තු මසදී CRIC 60 පොල් ප්‍රභේදය පැළ 317 ක් සිටුවා තිබූ අතර පැළ වලින් 3 න් 2 ක් පමණ විනාශ වී තිබීම හේතුවෙන් 2021 දෙසැම්බර් මසදී නැවත වරක් පැළ 216 ක් සිටුවන ලදී .සිටුවන ලද පැළ නඩත්තු කිරීම සඳහා යුධ හමුදාවට භාර දී තිබුණත් එම වගකීම ලිඛිත ගිවිසුමක්, අවබෝධතා ගිවිසුමක් මඟින් පවරා නොතිබුණි. 2022 වර්ෂයේ දී අසාර්ථක වීම හේතුවෙන් මෙම වගාව අතහැර දමා තිබුණි. සිටුවන ලද පැළ රැක බලා ගැනීම සඳහා ලිඛිතව යුධ හමුදාවට පවරා නොතිබීම හේතුවෙන් සිදු වූ නිශ්කාර්ය වියදමක් වශයෙන් විගණනයේදි නිරීක්ෂණය විය.	මෙහි සඳහන් කරුණු හා එකඟ වන අතර මින් ඉදිරියට මෙවැනි අඩුපාඩු සිදු නොවීම සඳහා පර්යේෂණ වගාවන් ස්ථාපනය කිරීමේ දී සෑම විටම අවබෝධතා ගිවිසුමක් මඟින් සම්බන්ධ වන අනෙකුත් පාර්ශවයට ලිඛිතව වගකීම් ලබා දීම කරන බව කාරුණිකව දන්වා සිටිමි.	පර්යේෂණ වගාවන් සාර්ථක කර ගැනීම සඳහා ආයතනයෙන් බැහැරව කරගෙන යන්නේ නම් එම පාර්ශවයට ලිඛිතව භාර දීමට කටයුතු කළ යුතුය.
(උ) 2022 සැප්තැම්බර් මස දී පොල් පර්යේෂණ ආයතනය විසින් කන්දකාඩු යුධ හමුදා ගොවිපලේ අක්කර 100 ක පොල් වගාවක් ආරම්භ කර තිබුණි. 2023 අගෝස්තු මස පොල් පර්යේෂණායතනය විසින් කළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී සිටුවා ඇති පොල් පැළ 1,443 කින් පැළ 1,200 ක් එනම් සියයට 83 ක් නියගයට ගොදුරු වී ඇති බව සඳහන් කර තිබුණි. යුධ හමුදාව හා පොල් පර්යේෂණ ආයතනය අතර අවබෝධතා ගිවිසුමේ III වගන්තියේ iii, iv යන උප වගන්ති වලින් බැහැරව බීජ පොල් උයන පවත්වා ගෙන ගොස් තිබුණි. බීජ පොල් උයන සඳහා පොල් පැළ මිලට ගැනීමට රු.525,000 ක මුදලක් දරා තිබූ අතර අමතරව දැරූ ප්‍රවාහන, කාර්යමණ්ඩල, අනෙකුත් වියදම් විගණනයට ඉදිරිපත් නොවූ අතර එලෙස දැරූ සියළු වියදම් නිෂ්කාර්ය වියදම් ලෙස නිරීක්ෂණය කෙරේ.	කෙටි කාලයක් තුල මෙම බීජ පොල් උයන ස්ථාපනය කර වියළි කලාපයට අවශ්‍ය බීජ පොල් සැපයීම අපගේ අරමුණ විය. නමුත් අනපේක්ෂිත සංක්‍රමණික අලි ගහණය වැඩිවීම නිසා තවදුරටත් මෙම කාර්යය ඉදිරියට ගෙනයාම අපහසු බව ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් දන්වා එවීම නිසා මෙම බීජ පොල් උයන අතරමග නවතා දැමීමට අපට සිදු වූ බව වැඩිදුරටත් දන්වා සිටිමි.	වගාව ආරම්භ කිරීමට පෙර පාරිසරික සාධක සලකා බැලිය යුතු අතර, වගාව ආරම්භ කළ පසුවද වගාවේ ආරක්ෂාව පිළිබඳ නිර්දේශ මණ්ඩලය විසින් විටින් විට ඉදිරිපත් කළ යුතුය.

(ඌ) පර්යේෂණ ආයතනයට අයත් ජාන සම්පත් මධ්‍යස්ථානයන්හි පවතින පොල් ගස් සංඛ්‍යාවට සාපේක්ෂව ඵල නොදරන පොල් ගස් සංඛ්‍යාව සියයට 1.9 සිට 47.7 ක් දක්වා පරාසයක පැවතුණි. ඵල නොදරන ගස් අදාළ අනුමැතිය සහිතව ඉවත් කිරීමටත් ඒ වෙනුවට නැවත සිටුවීමටත් ආයතනය කටයුතු කර නොතිබුණි. ජාන සම්පත් මධ්‍යස්ථාන 10 හි වූ මුළු පොල් ගස් සංඛ්‍යාව 97,566 ක් වූ අතර ඵල නොදරන ගස් සංඛ්‍යාව 6,878 ක් විය. සමස්තය සලකා බැලීමේදී සියයට 7 ක් ඵල නොදරන ගස් බව නිරීක්ෂණය විය.	පොල් පර්යේෂණ ආයතනයට අයත් වතු වල ඵල නොදරන ගස් සංඛ්‍යාව 20,166ක් ලෙස දක්වා තිබුණද එයින් 13,288ක් පැළ වගාව වශයෙන් පවතී. එනම් එම වගාවන් ඉදිරි කාලයේදී ඵලදාව ලබාදීමට නියමිතය. ඉතිරි ඵල නොදරණ ගස් ක්‍රමානුකූලව ඉවත් කර නව වගාව ආරම්භ කිරීමට නියමිතය. එම ප්‍රමාණය මුළු වගාවෙන් 7%ක් පමණි.	ඵල නොදරන ගස් ඉවත් කර නව වගාවන් ඇති කිරීමට සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුයි.
(එ)රු.2,240,342 ක මිලට ගැනීම් අත්තිකාරම් 06 ක් මාස 13 ත් මාස 21 ත් අතර වූ කාලයක් ගතවී ඇතත් නිරවුල් කිරීමට කටයුතුකර නොතිබුණි.	මෙහි නිරවුල් නොවී පැවති රු.2,240,342 වටිනාකම තුළ අත්තිකාරම් කිහිපයක් මේ වන විට පියවා ඇති අතර ඉතිරි අත්තිකාරම් 2025 වර්ෂය තුළ පියවීමට කටයුතු කරනු ලැබේ.	මු.රෙ 371 (6) ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඒ) පසුගිය දස වසරක (2014-2024) කාල පරාසය තුළ මණ්ඩලය යටතේ ඇති වතු 11 ක පොල් ඵලදාව පරීක්ෂාවට ලක් කිරීමේදී 2014 දී පොල් ඵලදාව ගෙඩි 5,693,680 ක් ද 2023 හා 2024 දී එම ඵලදාව පිළිවෙලින් ගෙඩි 3,546,815 ක් හා ගෙඩි 2,962,751 ක් විය. 2014 වර්ෂයට සාපේක්ෂව පොල් ඵලදාව අඩුවීම ප්‍රතිශතය සියයට 38 ක් හා සියයට 48 ක් වූයෙන් මණ්ඩලයේ පොල් ඵලදාව සැලකිය යුතු අඩු වීමක් නිරීක්ෂණය විය.	පොහොර පිළිබඳ පසුගිය සමයේ පැවති රාජ්‍ය ප්‍රතිපත්තිය හේතුවෙන් 2022 හා 2023 වර්ෂ වලදී පොහොර දැමීමක් සිදු වී නැති අතර 2024 දී පොහොර දමා තිබුණි. එම ඵලදාව ලබා ගැනීමට තවත් වසර 02 ක් ගතවේ. වතු කළමනාකරණ කමිටු රැස්වීම් වතු තාක්ෂණ කමිටු සාමාජිකයන් ද සහභාගී වන බැවින් තාක්ෂණ කමිටු නිරීක්ෂණ කළමනාකරණය වෙත ඉදිරිපත් කර ඇත. පොල් ඵලදාව වැඩිකිරීම සඳහා ක්‍රියාත්මක කරන ක්‍රම පොල් පර්යේෂණායතනයේ සිදු කරන ශෂ්‍ය විද්‍යාත්මක පර්යේෂණ මගින් නිර්දේශිත ක්‍රම වේ.පොල් ඵලදාව අඩු වීමට හේතුව 2022, 2023 වර්ෂවල පොල් පොහොර නොයෙදීමත් සුදුමැස්සා හානිය හේතුවෙන් පොල් ගස්වල තත්ත්වය බාල වීමය.	පොල් ඵලදාව වැඩිකර ගැනීම සඳහා විද්‍යාත්මක හා තාක්ෂණික කමිටු සහාය ලබාගෙන දුර්වලතා සඳහා පිළියම් යෙදිය යුතුයි.
(ඔ) පොල් පර්යේෂණ මණ්ඩලයේ සේවය කරමින් සිටියදී අධ්‍යයන නිවාඩු ලබා මණ්ඩලය සමඟ ඇතිකර ගත් සේවා ගිවිසුම උල්ලංඝනය කරමින් නැවත සේවයට වාර්තා නොකරන ලද නිලධාරීන් හතර දෙනෙකු හා නැවත සේවයට වාර්තා කොට අනිවාර්ය සේවා කාලය සම්පූර්ණ නොකර මණ්ඩලයේ සේවයෙන් ඉවත්ව ගිය නිලධාරීන් පස් දෙනෙකුගෙන් 2024 දෙසැම්බර් 12 දිනට මණ්ඩලයට රු.46,856,458 ක් අයවියයුතුව	සේවා ගිවිසුම කඩ කළ නිලධාරීන් 7 දෙනෙකුට එරෙහිව මේ වන විටත් නඩු පවරා ඇති අතර තවත් නිලධාරීන් දෙදෙනෙකුට එරෙහිව නඩු පැවරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් ඇත.	ගිවිසුම ප්‍රකාරව මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි.

තිබුණි. නිලධාරීන් හත් දෙනෙකුට අදාළව මාරවිල දිසා අධිකරණයේ නඩු කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතින අතර 2024 හා 2022 වර්ෂවලදී සේවය හැර ගිය නිලධාරීන් දෙදෙනාට විරුද්ධව නඩු පැවරීමට මණ්ඩලය මේ දක්වා කටයුතු කර නොමැති බව අනාවරණය විය.

3.3 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ආයතනයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 69 න් 36 ක් එනම් සියයට 52 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු පැවතුණි. තවද තෘතියික මට්ටමේ තනතුරු 43 න් 8 ක් ද ද්විතියික මට්ටෙම් තනතුරු 149 න් 48 ක් ද ප්‍රාථමික මට්ටමේ තනතුරු 130 න් 58 ක් පුරප්පාඩු වී තිබුණි.	2020 වර්ෂයේ සිට 2022.04.26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 මඟින් රාජ්‍ය වියදම් පාලනය කිරීම සඳහා ලබාදී ඇති උපදෙස් ප්‍රකාරව සියලු බඳවා ගැනීම් අත්හිටුවා තිබුණි. ආයතනයේ අත්‍යාවශ්‍ය පුරප්පාඩු පිරවීම සඳහා අනුමැතිය ලබාදෙන ලෙස අප විසින් අඛණ්ඩව සිදු කරන ලද ඉල්ලීම් හා සේවා අවශ්‍යතාවය සලකා බලා පුරප්පාඩු 67 ක් පිරවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2023 නොවැම්බර් මස සිට 2024 අප්‍රේල් මස තෙක් අවස්ථා 3 කදී ලබා දුන් අනුමැතීන් මත 2024 පෙබරවාරි සිට මේ වන තෙක් කාලසීමාව තුළ පුරප්පාඩු 26 ක් සඳහා නව බඳවා ගැනීම් සිදු කරන ලදි. අත්‍යවශ්‍ය සියලුම පුරප්පාඩු පිරවීම සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලයේ ක්‍රියාත්මක වන රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්ය මණ්ඩල කළමනාකරණය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිලධාරී කමිටුවේ අනුමැතිය සඳහා වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය වෙත 2025.02.25 දින ඉදිරිපත් කරන ලදි.	නිසි අනුමැතිය සහිතව පුරප්පාඩු වූ තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කළ යුතුය.